www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ආසියානු සුනාමිය, කත්‍රිනා කුනාටුව සහ කාශ්මීර භූමි කම්පාව: කම්කරු පන්තිය සඳහා පාඩම්

**The Asian tsunami, Hurricane Katrina and the Kashmir earthquake: lessons for the working class**

**සමාජවාදී සමානතා පක්ෂ ජනාධිපතිවරන අපේක්ෂක විජේ ඩයස් විසිනි**

**2005 ඔක්තෝබර් 10**

ලොව පුරා මහ ජනතාව උතුරු පකිස්ථානයේ සහ ඉන්දියාවේ සිදුවීම් දිගහැරෙමින් ඇති දවන්ත භීෂනයක් අත් දකිමින් සිටිති. දකුනු ආසියාව සුනාමියෙන් වැනසී ගොස් යාන්තම් දස මසකින් ද, කත්‍රිනා කුනාටුව එක්සත් ජනපදයේ දකුනු ප්‍රාන්ත හරහා හමා ගොස් දෙමසකින් ද අනතුරුව අති විශාල භූමි කම්පාවකින් කාශ්මීරයේ සහ ඒ අවට ප්‍රදේශවල 70,000කට අධික පිරිසක් මිය ගියහ.

පාලනය කල නොහැකි ස්වභාවධර්මයේ බලවේග ඔක්තෝබර් 8 භූමි කම්පාව ඇති කලේ ය. එහෙත්, ආසියානු සුනාමියේ සහ එක්සත් ජනපද කුනාටුව සේම මිනිස් ඛේදවාචකයේ බිහිසුනු සහ ඉහල නැගෙන ප්‍රතිවිපාක, සමාජ අවශ්‍යතාවන් ධනවාදී වෙලඳ පොලේ අරාජකත්වයට යටත් කර දමන යල්පිනූ ආර්ථික පද්ධතියේ නිමැවුමකි. දවැන්ත භූකම්පනය ඉන්දියාවේ සහ පකිස්ථානයේ හදිසි සේවාවන්හි ශෝචනීයත්වය, නිසි පරිදි ඉදි කෙරුනු නිවාස මංමාවත් සහ අනෙකුත් යටිතල පහසුකම් නොමැතිකම සහ වෛද්‍ය සේවාවල, සන්නිවේදනයේ සහ අත්‍යවශ්‍ය සේවාවල නොසෑහෙන බව එලිදරව් කර තිබේ.

දකුනු ආසියාවේ කම්කරුවන්ට යලිත් වතාවක් ඉස්ලාමාබාදයේ සහ නව දිල්ලියේ දේශීය පාලන තන්ත්‍රයන්හි සාපරාධී නොසැලකිල්ල පිලිබඳව පමනක් නොව වොෂින්ටනයේ, ලන්ඩනයේ, ටෝකියෝවේ සහ අනෙකුත් අගනගරයන්හි ''ලෝක නායකයින්ගේ'' නරුමත්වය සහ කුහකත්වය පිලිබඳව ද වෛෂයික පාඩමක් උගන්වා තිබේ. කනස්සල්ලේ සියලු නරුම ප්‍රකාශන තිබිය දී ම ඩොලර් මිලියන 300ක් තරම් වන ජාත්‍යන්තර සහනාධාර දිවි රැක ගත්තවුනට සිය ජීවිත යලි ගොඩනගා ගැනීමට තබා වහාම අවශ්‍යවන හදිසි අවශ්‍යතාවන්ට වත් නොසෑහෙයි.

නිවාස අහිමි වූ සංඛ්‍යාව මිලියන 3 ඉක්මවන බව තක්සේරු කර තිබේ. කඳුකර ප්‍රදේශයේ මංමාවත් පිලිසකර නොකිරීම ද හෙලිකොප්ටර් ප්‍රවාහනයේ බරපතල හිඟකම ද හේතුවෙන් හදිසි සහන සේවා සපයන්නන්ට බොහෝ ප්‍රදේශ අහලකට වත් ලඟාවීමට නොහැකිව තිබේ. එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර වැඩ සටහන විසින් අඟහරුවාදා පල කල ප්‍රකාශනයක ගනන් බලා තිබුනේ පන් ලක්ෂයයක් දෙනාට තවමත් සහන සේවා සැලසී නැති බව ය. අවට ප්‍රදේශවලින් තුවාලකරුවන් දිගටම ගලා එන හෙයින් වෛද්‍යවරුන් ද හා ශල්‍ය වෛද්‍යවරුන් ද 24 පැය ම වැඩෙහි යෙදී සිටිති. තාවකාලික වාසස්ථාන කැඩී බිඳී ගියා වූද තමන් සතු සියල්ල අහිමිවුනා වූද විපතට පත් අති විශාල බහුතරය දුගීන් ය.

එක්සත් ජාතීන්ගේ මහ ලේකම් කොෆි අනන් ඊයේ ජාත්‍යන්තර ආධාර හිඟකම පිලිබඳව ලිහිල් ලෙස විවේචනය කල අතර තවත් විනාශයක් මග එන බවට අනතුරු ඇඟවී ය. හිමාලයානු ශීත සෘතුව එලඹෙමින් තිබිය දී දනටමත් හිමාංකයෙන් පහල උෂ්නත්වයක් යටතේ ජීවත් වන ලක්ෂ ගනන් ජනතාව සුදුසු නවාතැන්, ඇඳුම් පැලඳුම් හා ආහාර නොමැතිව සිටියි. ආධාර වැඩිපුර නොලැබුන හොත් ශීතලෙන් සහ වලක්වා ගත හැකි රෝගාබාධයන්ගෙන් දහස් ගනනින් මිය යනු ඇතැයි අනන් ප්‍රකාශ කලේ ය.

ඉන්දු උප මහාද්වීපය රෝගී තත්වයට පත් කල දරිද්‍රතාවයේ උල්පත අභිරහසක් නො වේ. එය පීඩිත සහ පීඩක රටවල් අතර එදිනෙදා ක්‍රියාත්මක වන ආර්ථික සබඳතාවන්ගේ ප්‍රතිඵලයකි. අන්තර්ජාතික සංගතයන්ගේ දවැන්ත ලාභ ඉන්දියාව සහ පකිස්ථානය වැනි රටවල නොසිඳෙන ලාභ ශ්‍රම සැපයුම ලබා ගැනීම මත සෘජුවම රඳා පවතී. දකුනු ආසියාව පුරා කෝටි සංඛ්‍යාත ජනතාව නිරපේක්ෂ දරිද්‍රතාවයේ ගිලී

සිටීම නිව් යෝර්කයේ ටෝකියෝවේ සහ ලංඩනයේ සුපිරි පොහොසතුන්ගේ අධි සුඛෝපභෝගී ජීවන රටාවට ඉඳුරා ම අවශ්‍ය වන පූර්ව සාධකයකි.

ඇමරිකානු ජනාධිපති ජෝර්ජ් බුෂ් සහ බ්‍රිතාන්‍ය අගමැති ටෝනි බ්ලෙයාර් භූමි කම්පාවට දක්වූ ප්‍රතිචාරය ආසියාවේ, අප්‍රිකාවේ හා ලතින් ඇමරිකාවේ අන්ත දුගී බවට පත් ජනතාව කෙරෙන් ඔවුන් නියෝජනය කරන පාලක තන්ත්‍රයන් දක්වන පිලිකුල සහ නොතැකීම පිලිබිඹු කරයි. වොෂින්ටනය පොරොන්දු වූ ඩොලර් මිලියන 50 සහ මිලිටරි හෙලිකොප්ටර් කීපයක් සැපයීම ඉරාකය ද එහි තෙල් සංචිත ද අල්ලා ගැනීමට කැප කරන දැවැන්ත ඇමරිකානු සම්පත් සමග සසඳා බැලීමේ දී නොසැලකිය යුතු තරම් ය.

ලෝක කොටස් වෙලඳ පොලවලට භූමි කම්පාව දැනුනේ වත් නැත. ඒ ඉන් කිසිදු ප්‍රධාන ආයෝජනයකට හෝ තීරනාත්මක සම්පත්වලට හෝ බලපෑමක් නොවූ හෙයිනි. ගෝලීය සමාගම් අයිතිකරුවන්ගේ උත්සුකය පවතින්නේ හානියට පත්වූවන්ගේ ක්‍රය ශක්තිය පිබඳව පමනකි. ලෝකයේ අනෙකුත් තැන්වල කම්කරුවන්ගේ වැටුප් හා සේවා කොන්දේසි මිරිකා දැමීමට කැඳවා ගත හැකි දැවැන්ත ලාභ ශ්‍රම හමුදාවක් ලෙස පැවතීම ගැන පමනක් ඔවුන් උනන්දු වෙති.

බුෂ්, බ්ලෙයාර් සහ අනෙකුත් නායකයින්ගේ ආධාර හා කනස්සල්ල පල කිරීම ඔවුන්ගේ දේශීය මිතුරන් නගාසිටුවීම ඔවුන්ගේ ආර්ථික හා මූලෝපායික න්‍යාය පත්‍රයන් පෙරට ගෙනයාමටත් අවශ්‍යවන ප්‍රමානයට පමනක් සීමා විය. පකිස්ථාන් ජනාධිපති පර්වේස් මුෂාරෆ් දැනට මත් බුෂ් ගේ ''ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය'' ට සහ ඇෆ්ඝනිස්ථානයේ එක්සත් ජනපද ආක්‍රමනයට සහාය දීම නිසා කොටුවී සිටියි. ඔහුගේ සැලෙන බල හස්තය තව දුරටත් දුබල කරවමින් භූමි කම්පාවෙන් විපතට පත් වූවනට සැලකියයුතු පරිදි ආධාර සැපයීමට අසමත් වීමේ හේතුව මත ඔහු දැඩි ප්‍රහාරයකට මුහුන දී සිටී.

ඉන්දියාව සහ පකිස්ථානය අතර ඊනියා සාම ක්‍රියාවලිය තව දුරටත් ඉදිරියට තල්ලු කිරීම පිනිස මෙම ඛේදවාචකය ප්‍රයෝජනයට ගැනීමට ද වොෂින්ටනය උනන්දුවක් දක්වයි. අඩ සියවසකට වැඩි කලක් තිස්සේ යුද්ධ තුනකට ද 2002 තරම් මෑතක දී තවත් යුද්ධයක තර්ජනය මතු කරමින් ද දෙරට අතර විරුද්ධවාදීකම්වල හරි මැද පිහිටියේ කාෂ්මීරය යි. උප මහාද්වීපය තුල 'සාමය' සඳහා වන බුෂ් පරිපාලනයේ තල්ලුව ගෝලීය ආර්ථිකය සහ මූලෝපායික ආධිපත්‍යය සඳහා වන පලල් ඇමරිකානු අභිලාෂයන්ගේ කොටසකි. ලාභ ශ්‍රමයේ ප්‍රධාන උල්පතක් ලෙස ද චීනයට විරුද්ධව ශක්‍යතාව ඇති සගයකු ලෙස ද ඉන්දියාව මෙම සැලසුම්වල තීරනාත්මක මූලික සාධකයක් වෙයි.

ඉන්දුනීසියාවේ, ශ්‍රී ලංකාවේ, තායිලන්තයේ සහ ඉන්දියාවේ තුන්ලක්ෂයකට අධික ජනතාව මරුමුවට පත් කල ආසියානු සුනාමියට ලෝක නායකයන් දක්වූයේ ද මෙම ප්‍රතිචාරය ම ය. ලොව පුරා සාමාන්‍ය කම්කරු ජනතාවගේ උතුරාගිය අනුකම්පාව ද සහයෝගය ද හමුවේ ඔවුන්ගේ නොතැකීම එලිදරව්වීමේ තර්ජනය ඇතිවන තුරු ම බුෂ් හා බ්ලෙයාරේ තමන්ගේ නිවාඩු චාරිකා සැලසුම් වෙනස් කිරීම පවා ප්‍රතික්ෂේප කලහ. ඛේදවාචකයේ අති විශාල පරිමානය පැහැදිලි වන විට ධවල මන්දිරය ඉන්දුනීසියාවේ අචේ ප්‍රාන්තයේ ද ශ්‍රී ලංකාවේ ද ''සාම ක්‍රියාවලිය''ට බලපෑම් කිරීම ද ඇතුලු තමන්ගේ ම අරමුනු වෙනුවෙන් එය යොදා ගත්තේ ය. දකුනු ආසියාවේ මිලිටරි රැඳවුම් යලි පිහිටුවීමේ එක්සත් ජනපද දිගුකාලීන අපේක්ෂාවන් සමග එකට පිහිටමින් ඇමරිකානු හමුදා ඉන්දුනීසියාවේ සහ ශ්‍රී ලංකාවේ ආධාර සැපයීමේ මෙහෙයුම්වලට එකතු විය. ව්‍යසනයෙන් දස මසකට පසුව ද දිවි බේරා ගත් ලක්ෂ ගනන් ජනතාව තවමත් ඉක්මන් විසඳුමක් නොලැබ අපිරිසිදු, තාවකාලික කූඩාරම් හා හල්වල ජීවත් වෙති. ජනවාරියේ දී මහා ඝෝෂාවක් සහිතව ජකර්තා සමුලුවේදී පොරොන්දු වූ ඩොලර් බිලියන 4ක ජාත්‍යන්තර ආධාරවලින් වැඩි ප්‍රමානයක් ලැබුනේ නැත. අඩුම තරමින් නිවාස 80,000ක් විනාශ වූ ශ්‍රී ලංකාවේ තවමත් සාදා නිම කර ඇත්තේ නිවාස 1,126ක් පමනක් වන අතර තවත් 15,619ක් ඉදිකිරීමේ විවිධ අදියරයන්හි තිබේ. කොලඹට ලැබුනු සීමිත ජාත්‍යන්තර ආධාරවලින් වැඩි කොටස නිකම්ම අතුරුදහන් වී ඇත.

## ඇමරිකානු කම්කරු පන්තිය

කත්‍රිනා කුනාටුව කම්කරු පන්තිය සඳහා වඩාත් විශාල පාඩම් අන්තර්ගත කර ගනී. මෙම බිහිසුනු ඛේදවාචකය ලෝක අධිරාජ්‍යවාදී මධ්‍යස්ථානය වන ඇමරිකාව තුල පන්ති සබඳතාවයේ නියම තත්වය එලිමහනට ගෙන ආවේ ය.

පලමුව එයින් ඇමරිකාවේ පන්ති බෙදීම් ඇත්තේ නැතැයි ද එහි කිසිවකු දුප්පත් කමේ හෝ අගහිගකමට වැටී නැතැයි ද යන සුරංගනා කථාවට දැඩි පහරක් එල්ල විය. කාශ්මීරයේ හෝ ශ්‍රී ලංකාවේ සේම නිව් ඕර්ලියන්ස්හි විපතට පත්වූවන් ද දුගීන් ය. රථ වාහන තිබූ අය නගරය හැර ගිය අතරේ එසේ කල නොහැකි වූ අයට සුපර් ඩෝමයේ (ගොඩනැගිල්ලකි) හෝ සමුලු මධ්‍යස්ථානයේ පුලුපුලුවන් ආකාරයට රැඳී සිටීමට සිදු විය. වාර්තාකරුවන්ට පිලිගැනීමට සිදු වූ ආකාරයට දුගී ජන ප්‍රදේශයන්හි විනාශයේ දර්ශන ගාල්ලේ හෝ බන්ඩා අචේ හි චිත්‍රපට ගත කර ගත හැකිව තිබුනි.

දශක ගනනාවක් තිස්සේ ආසියාවේ විවිධාකාර රැඩිකල් ජාතිකවාදීන් ඇමරිකානු කම්කරු පන්තිය නොතකා හැර හෝ, එවැන්නක පැවැත්ම පවා

ප්‍රතික්ෂේප කර තිබුනි. එහෙත්, ඉන්දු උප මහාද්වීපයේ කම්කරුවන් ඇමරිකාවේ ඔවුන්ගේ පන්ති සොහොයුරන් හා සොහොයුරියන් සේම එකම බෝට්ටුවේ සිටින්නේ ය යන අති මූලික පන්ති සත්‍යය සියලු දෙනාගේ ඇස් පනාපිට දිස්ව තිබේ.

දෙවනුව, නිව් ඕර්ලියන්ස්හි කම්කරුවන් පිලිබඳව ඇමරිකානු පාලක පන්තියේ ආකල්පය ආසියානු සුනාමියෙන් හා කාෂ්මීර භූමිකම්පාවෙන් විපතට පත් වූවන්ට දැක්වූ ආකල්පයට හරියට ම සමානය. තමන්ගේ නිවාඩු සැලසුම් දෙසැම්බරයේ දකුනු ආසියාවේ දුගී ගම්මුන් වෙනුවෙන් වෙනස් කිරීමට නුසූදානම් වූ තරමටත් වඩා වැඩියෙන් අගෝස්තුවේ ඇමරිකානු කම්කරුවන් වෙනුවෙන් වෙනස් කිරීමට සූදානම් නොවී ය. කත්‍රිනා කුනාටුව පැමිනීමට පෙර ද එය පැමිනි විට ද ඉන් පසුව ද බුෂ් පරිපාලනයේ ප්‍රතිචාරයෙහි මූලධර්මය වූයේ සංගත ප්‍රභූවේ උවමනාවන් ආරක්ෂා කිරීම ය.

දින ගනනාවක අනතුරු ඇඟවීම් තිබිය දී ම ආන්ඩුව එහි වඩාත්ම අනාරක්ෂිත පුරවැසියන්ට උදව් කිරීම පිනිස කිසිදු වෑයමක් නොදැරී ය. කුනාටුවත් සමග ම ආන්ඩුව පුද්ගලික සංගතවලට ප්‍රතිසංස්කරන කටයුතු පවරා දීමටත් සිවිල් සමාජය මිලිටරීකරනයේ සිය සැලසුම් පෙරට දැමීමට ත් කොන්දේසි සකස් කර ගත්තේ ය. ශ්‍රී ලංකාවේ, පකිස්ථානයේ හෝ ඇමරිකාවේ වුව ද පාලක පන්තියේ දෙපා වෙව්ලන ප්‍රතිචාරය වූයේ සහන සැලසීමට නොව පුද්ගලික දේපල ආරක්ෂාවට හා විරෝධතාවයක යම් හෝ ඇඟවීමක් වෙතොත් එය අතුගාදමනු පිනිස සන්නද්ධ හමුදාවන්ගෙන් වීදි පිරවීම සිත් කාවදින සුලු ය.

තුන්වනුව, කත්‍රිනා කුනාටුව වෙලඳ පොල මිථ්‍යාව එලි දරව් කලේ ය. දශක ගනනාවක් තිස්සේ ''ආර්ථික ප්‍රතිසංස්කරන''යේ නියෝජිතයන් මෙම සැලැස්මේ සාර්ථකත්වයෙහි නිදසුන ලෙස ඇමරිකාව හුවා දැක්වූහ. විවේචකයන් නිහඬ කරනු පිනිස ඔවුහු ''ආසන්න වේදනාව'' අවසානයේ දී ''අනාගත පල ප්‍රයෝජන'' වලට මග පාදන්නේ යයි තර්ක කරමින් ඉවසා සිටින ලෙස ඉල්ලා සිටිය හ. සියල්ලටම පසුව මහා ධනසම්භාරයේ ඇමරිකානු උදාහරනය දෙස බලන්න! ඇමරිකාව තුල දශක ගනනාවක ආර්ථික ප්‍රතිව්‍යුහ ගත කිරීම පෝසතුන් හා දුප්පතුන් අතර වඩා ගැඹුරු වන බෙදීමක් පමනක් නොව තුන්වන ලෝකයේ තත්වයන් හා සරිලන ආකාරයේ දැඩි ලෙස බාදනය වී ගිය යටි තල පහසුකම් ක්ෂේත්‍රයක් ද නිර්මානය කර තිබේ. මෙක්සිකන් බොක්කේ කුනාටුවක් විදුහල්වල සහ සරසවිවල උගන්වන පෙලපොත්වලට අඩංගු කාරනයක් වුවද සිද්ධියට පෙරාතුව ජනතාව ඉවත් කරලීමට හෝ ඉන් පසුව මූලික හදිසි සේවාවන් සපයා දීමට හෝ ආන්ඩුවේ ආයතන මුලුමනින් ම අසමත් බව ඔප්පු කර පෙන්වී ය.

පසු ගිය සතියේ රූපවාහිනී කැමරා ඉදිරිපිට බුරා පැන්න ජනාධිපති මුෂාරෆ්, පකිස්ථානු පාලක ප්‍රභූව කත්‍රිනා කුනාටුවෙන් නිගමනයන් උපුටා ගත් බව සැඟවීමට උත්සාහ දැරී ය. නැගී එන විවේචනවලින් තමන් ආරක්ෂා වෙමින් කුනාටුවට ගොදුරු වූවන්ට සහන සැලසීම ඇරඹීමට ජනාධිපති බුෂ්ට දින ගනනනාවක් ගත වූවත් තමන් පැය 24ක් ඇතුලත ඊට යොමු වූ බවත් ජනරාල්වරයා ප්‍රකාශ කලේ ආවේශයෙන් මෙන්ය. වෙනත් ලෙසකින් කිවහොත්, භූමිකම්පාවෙන් විපතට පත් වූවන්ට සහන හා ආධාර සැපයීමේ දී තම ආන්ඩුව දක්වූ අසමර්ථකම යුක්ති සහගත කරනු පිනිස මුෂාරෆ් නිව් ඕර්ලියන්ස් කම්කරුවන්ට බුෂ් පරිපාලනය දක් වූ සාපරාධී නොසැලකිල්ල හා පිලිකුල ඩැහැ ගත්තේ ය.

ජාත්‍යන්තර කම්කරු පන්තිය මීට මුලුමනින්ම වෙනස් වූ නිගමනයන් කරා පැමිනිය යුතු ය. සියල්ලන් සඳහා යහපත් ජීවන තත්වයන් සම්පාදනය කිරීම තබා ස්වාභාවික විපත්වලට එරෙහිව අති මූලික රැකවරනය සැපයීමටවත් නොහැකි ආර්ථික හා සමාජ පර්යායක් පැවතිය යුතු නැත. නිව් ඕර්ලියන්සයේ, කොලඹ හෝ ඉස්ලාමාබාදයේ වේවා කම්කරුවන් ලාභ පද්ධතිය සහ ලෝකය යල්පිනූ ජාතික රාජ්‍යයන් අතර බෙදාලීම අහෝසිකර දැමීමේ පොදු උවමනාවකින් යුක්තව සිටියි.

ධනේශ්වර රාජ්‍ය පද්ධතියේ ප්‍රතිගාමී ස්වභාවය ඉන්දු උප මහාද්වීපයේ තරම් අන් කවර තැනකවත් සුපැහැදිලි නැත. බ්‍රිතාන්‍ය විජිත පාලකයින් හා දේශීය ධනේශ්වරය අතර අධම ගනුදෙනුවක ප්‍රතිඵලය ලෙස 1947 වාර්ගික රේඛා ඔස්සේ පිහිටුවන ලද පකිස්ථානය හා ඉන්දියාව අඩ සියවසක යුද හා ජන විලෝපන නිර්මානය කලේ ය. මෙම බෙදීම්වල විකාර සහගත බව පකිස්ථාන ජනාධිපති වර්තමාන ඉන්දියාවට අයත් ප්‍රදේශයක ද ඉන්දීය අගමැති වර්තමාන පකිස්ථානයට අයත් ප්‍රදේශයකද උපත ලබා තිබීමෙන් මතු කර පෙන්වයි. එහෙත් මේ දෙන්නාම භූමියෙන් අඟලක් හෝ අතහැරීම වෙනුවට උප මහාද්වීපයේ න්‍යෂ්ටික යුද්ධයක් ඇරඹීමට පෙලඹෙනු ඇත.

දෙසැම්බර් 26 සුනාමිය ඉන්දියාවේ, ශ්‍රී ලංකාවේ සහ ඉන්දියාවේ ජාතික දේශ සීමාවන්ට දැක්වූ ගරුසරුවට වැඩි යමක් ඔක්තෝබර් 8 භූමිකම්පාව කාෂ්මීරය බෙදා වෙන් කෙරෙන රේඛාවන් පිලිබඳව ද නොදැක් වී ය. එහෙත් සටන් නැවැත්වීමේ රේඛාවෙන් දෙපැත්තේ සිටි ඉන්දීය හා පකිස්ථාන හමුදාවල ආසන්න ප්‍රතිචාරය වූයේ විපතට පත් වූවන්ට පිහිට වීම නොව විරුද්ධ කාරයා වාසියක් ලබා ගැනීම වැලැක්වීම ය. මාධ්‍ය වාර්තාකරුවන් සාමයට ඇති ඉඩකඩ පිලිබඳව සමපේක්ෂන කරන්නේ වුවද කාෂ්මීරය තුල ඇමරිකාව

අනුග්‍රහය දක්වන ඕනෑම විසඳුමක් තාවකාලික විරාමයකට වැඩි යමක් නොවනු ඇත. ඉන්දියාවේ හා පකිස්ථානයේ පාලක පන්තීන් දුගී ජනතාව බේද කරමින් ඔවුන්ගේ පාලනය සුරක්ෂිත කර ගැනීමට නැවත නැවතත් වාර්ගික හා ජාතික දේශපාලනය කලඹවා ඇති අතර ඔවුන් ඉදිරියේ ද එසේ කරනු ඇත.

ඉන්දු උප මහාද්වීපය පුරා සිටින කම්කරුවන් සඳහා බංකොලොත් ධනපති පද්ධතියට සමාජවාදී විකල්පයක් ඉදිරිපත් කරනු පිනිස මම ශ්‍රී ලංකාවේ ජනාධිපති වරනයේ දී සමාජවාදී සමානතා පක්ෂයේ අපේක්ෂකයා ලෙස පෙනී සිටිමි. කොලඹ, නව දිල්ලියේ, හෝ ඉස්ලාමාබාදයේ බල කඳවුරු අතරින් කම්කරු පන්තියට මිතුරන් සොයාගත නොහැකි අතර ඔවුන් සොයාගත යුත්තේ කලාපය පුරා ද ඇමරිකාවේ ද ජාත්‍යන්තරව ද විසිර සිටින තමන්ගේ පන්ති සොහොයුරන් හා සොහොයුරියන් අතරින් ය. අල්පතරයකගේ ලාභය වෙනුවට බහුතරයේ දුවෙන අවශ්‍යතා තෘප්තිමත් කිරීම මත පදනම් වූ සමාජ පද්ධතියකින් ධනවාදය විස්ථාපනය කිරීමේ භූගෝලීය අරගලයේ කොටසක් ලෙස උප මහාද්වීපයේ  කම්කරු පන්තිය එක්සත් කිරීමේ සහ මෙහෙයවීමේ මාවත ලෙස දකුනු ආසියාවේ එක්සත් සමාජවාදී ජනපදයකට අපි සටන් කරමු.

© www.wsws.org